# ද්විතීය පලාස ජාතකය

තවද මාගේ ස්වාමිදරුවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසනසමයෙහි පලාස පරිබ්‍රාජකය නම් එකෙකු අරභයා මේ ජාතකය දක්වන ලද

ඒ කෙසේද යත්,

පලාසනම් පරිබ්‍රාජකයෙක් බොහෝ මනුෂ්‍යයන් පිරිවරා ජේතවනාරාමයට සර්වඥයන් හා තර්කයට ගොස් සර්වඥයන්ගේ චන්ද්‍රමණ්ඩලයමෙන් සශ්‍රීක වූ මුඛශ්‍රීය දැක මා මුන්ලා කැටිව තර්කකරන්නට බැරියයි සිතා පිරිස් හඬ පවත්වා සිටියාහ, සර්වඥයෝත් උපාසකවරුනි දැන්මතුනොවෙයි පෙරත් මාගේ මුඛමණ්ඩලය දැක බිඳුනේවේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළ සේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නමින් බෝධිසත්වයන් වහන්සේ රාජ්‍යය කරණ සමයෙහි තක්සලා නුවර රාජ්ජය කරන්නාවූ රජ්ජුරුකෙනෙක් චතුරංගී සේනාව පිරිවරා බරණැස් නුවර වටකොට ගත්හ. එවිට ගන්ධාර නම් රජ්ජුරුවෝ තමන්ගේ සේනාවගේ බලය කියන්නාහූ රථවල නගන්නාවූ බොහෝ ධජවලින් සම්පන්න වූ මාගේ චතුරංගිනි සේනාව පිරිවරා ඉක්මවා බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ කෙසේ පලායෙද්ද මහා සමුද්‍රයෙහි යම්සේ පක්ෂියෙක් පියඅඹා තීරණයක් දක්ක නොහෙද්ද යම්සේ මහත්වූ පර්වතයක් පුළුන් රලකින් සොලවාලිය නොහෙද්ද එමෙන් මාගේ චතුරංගිනි සේනාව තොප විසින් බිඳුවා පිය නොහැකියි කියා කීහ. එබස් අසා බරණැස් රජ්ජුරුවෝ අට්ඨාලයෙහි සිටිතැනැත්තෝ  ගන්ධාර රජ්ජුරුවන්ට කියන්නාහූ එඹල තොපි විසින් නිකම් ප්‍රලාප කීම්කිම්ද තොපගේ සේනාව විසින් මාගේ සේනාව මැඩපියන්ට බැරිය කියා කීහ. එබස් අසා ගන්ධාර රජ්ජුරුවෝ බරණැස් රජ්ජුරුවන්ගේ පුන් සඳක් සමානවූ මුඛශ්‍රීයක් ඇති රජ්ජුරුවන්ට මා විසින් යුද්ධකරන්ට බැරියයි සිතා තමන්ගේ රටට ගියාහයි වදාරා ද්විතීය පලාස ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි ගන්ධාර රජ්ජුරුවෝ නම් පලාස පරිබ්‍රාජකය, බරණැස්නුවර රජ්ජුරුවෝ නම් බුදුවූ මම්මයයි වදාළසේක.